ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
**National Secretariat for Elders**

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
**Ministry of Rural Development, Social Security and Community Empowerment**

*සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා* -செயலூக்கமான முதுமையை நோக்கி- *Towards an active ageing*

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | NSE/DEV/11/XV/01/පොදු | |
| ඔබේ අංකය / உனது இல. / Your No. | | |
| දිනය / திகதி / Date | 2025.04.29 | |

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
.........................................

**ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස (වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන) ප්‍රමිතිගත කිරීම වෙනුවෙන් අලුත්වැඩියාව හා උපකරණ ලබා දීම - 2025**

ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වැඩිහිටි උවටැන් නිවාස ප්‍රමිතියට (1506:2015) අනුකූලව පවත්වාගෙන යාම සඳහා එහි පවතින අඩුපාඩු සහ විවිධ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට ඉහත වැඩසටහන මඟින් 2025 වර්ෂය තුළ වැඩිහිටි නිවාස 20 ක් වෙනුවෙන් එක් වැඩිහිටි නිවාසයකට රුපියල් මිලියන 02 ක උපරිමයකට යටත්ව ප්‍රමුඛතාවය මත ආධාර මුදල් ලබා දීමට භාණ්ඩාගාර අරමුදල් වෙන් වී ඇත.

02. ඒ අනුව උක්ත වැඩසටහනට අදාල උපදෙස් පත්‍රිකාව මේ සමඟ අමුණා ඇති අතර,ඊට අනුකූලව සුදුසුකම් සපුරාලන වැඩිහිටි නිවාස, සිදු කල යුතු අලුත්වැඩියාවන් /උපකරණ ලබා ගැනීම් සම්බන්ධයෙන් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව (ඇමුණුම 02) සම්පූර්ණ කර සහ ඊට අනුකූලව සකස් කරන ලද විධිමත් ඇස්තමේන්තුවද සමඟ 2025.06.30 වන දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

03.එසේම ඉහත වැඩසටහන යටතේ ආධාර මුදල් ලබා දෙන සෑම වැඩිහිටි නිවාසයක් සමඟ ගිවිසුම්ගත විය යුතු අතර "දෙපාර්ශවයක් අතර ඇතිකර ගන්නා අවබෝධතා ගිවිසුම" (ඇමුණුම 04) සහ වැඩිහිටි නිවාසය පිහිටි ඉඩම රජයේ ඉඩමක් නොවන සෑම අවස්ථාවකදීම එම ඉඩම අයත් සංවිධානය /ආයතනය /පුද්ගලයා හෝ පුද්ගලයින් මේ සමඟ අමුණා ඇති "දෙපාර්ශවයක් අතර ඇතිකර ගන්නා එකඟතා ගිවිසුම" (ඇමුණුම 03) ද නිසි පරිදි අත්සන් කර මා වෙත යොමු කල යුතුය.

04. එමෙන්ම මෙම කාර්යය කෙරෙහි ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර දිස්ත්‍රික්කය තුල පිහිටි මෙම ආධාරය ලබා දීමට වඩාත්ම සුදුසු වැඩිහිටි නිවාසය තෝරා විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදුකර සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු මඟින් අදාල කාර්යය 2025.11.30 වන දිනට පෙර අවසන් කර 2025.12.15 ට පෙර අදාළ බිල්පත් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතු අතර, මෙම ව්‍යාපෘතිය 2026 වර්ෂයට අඛණ්ඩ නොවන බැවින් 2025 මෙම වර්ෂය තුළ වැඩ අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් තෝරා ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

05.මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

කේ.චතුර මිහිදුම්
අධ්‍යක්ෂ

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை
Address : 2nd Floor,Block D, Sethsiripaya- II Stage, Baththaramulla.
ඊ-මේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
ෆැක්ස්/ பெக்ஸ் / Fax : 0112187015

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office
සංවර්ධන අංශය :0112054164
ආයතන අංශය :0112054136
ගිණුම් අංශය : 0112054138

Scanned with CamScanner

# ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස(වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන) ප්‍රමිතිගත කිරීම වෙනුවෙන් අළුත්වැඩියාව හා අවශ්‍ය උපකරණ ලබාදීම - 2025

## 1. හැඳින්වීම.

ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැඩිහිටි නිවාස වල නේවාසික වැඩිහිටි මව්පියවරුන් 10000 කට අධික පිරිසක් සඳහා පහසුකම් සපයා ඇති අතර ඔවුන් විවිධ රෝගී තත්වයන්ට, මානසික තත්වයන්ට මුහුණ දෙමින් තම සැඳෑ සමය ගෙවා දමන නමුත්, ඇතැම් වැඩිහිටි නිවාස විධිමත් හා පොදු ප්‍රමිතියක් යටතේ පවත්වාගෙන යන බවක් දක්නට නොලැබේ. මේ තත්වය තුළ දිනෙන් දින වේගයෙන් ඉහළ යමින් පවතින වැඩිහිටි ප්‍රජාව රැක බලා ගැනීම රටට විශාල අභියෝගයක් වන බැවින් වැඩිහිටි නිවාස සඳහා ඇති ඉල්ලුම ඉහළ ගොස් ඇත. පැය 24 පුරා සෞඛ්‍යාරක්ෂිත, ආරක්ෂිත රැකවරණයන්ගෙන් සමන්විත සහ ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලන වැඩිහිටි නිවාස විධිමත් හෝ පොදු ප්‍රමිතියක් යටතේ පවත්වාගෙන යාම, නේවාසික වැඩිහිටියන්ගේ වර්තමානය සහ අනාගතය වෙනුවෙන් සුරක්ෂිත, ගුණාත්මක සහ ඵලදායි සේවාවන් වෙනුවෙන් සහ එහි පරිපාලනමය හා අධීක්ෂණ කටයුතුවලට ද මහෝපකාරී වන අයුරින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වැඩිහිටි උවටැන් නිවාස ප්‍රමිතියට අනුකූලව (1506:2015) වැඩිහිටි නිවාසයන්හි පවතින අඩුපාඩු අවශ්‍යතා හඳුනාගනිමින් ඔවුන්ගේ ඉල්ලීම් පදනම් කරගෙන මෙම ව්‍යාපෘතිය හරහා 2025 වර්ෂයේදී වැඩිහිටි නිවාස 20 ක් වෙනුවෙන් එක් වැඩිහිටි නිවාසයකට රුපියල් මිලියන 02 ක උපරිමයකට යටත්ව ආධාර මුදල් ලබා දීම කරනු ලබයි.

## 2. ව්‍යාපෘතියේ අරමුණු:

1. වැඩිහිටි නිවාසගත වැඩිහිටියන්ට තම සැඳෑසමය ආරක්ෂිතව හා සතුටින් ගත කිරීමට සුදුසු වැඩිහිටි නිවාස ඇති කිරීම.
2. වැඩිහිටි නිවාසගත වැඩිහිටි මව්පියවරුන්ට වඩා හොඳ පහසුකම් සලසා දීම.
3. ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන සියළුම වැඩිහිටි නිවාස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වැඩිහිටි උවටැන් නිවාස ප්‍රමිතියට අනුකූලව (1506:2015) පවත්වාගෙන යාම සඳහා කටයුතු සලසා දීම.

## 3.ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

- පහත සඳහන් තෝරා ගැනීමේ නිර්ණායක අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් අළුත්වැඩියා සිදු කිරීමට සුදුසුම වැඩිහිටි නිවාස තෝරා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතුය.

1. පවත්වාගෙන යනු ලබන සෑම වැඩිහිටි නිවාසයක්ම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර තිබිය යුතුයි.
2. වැඩිහිටි නිවාසය ආරම්භ කර වසරකට වඩා වැඩි කාලයක් පවත්වාගෙන යනු ලබන එකක් විය යුතුයි.
3. නොමිලයේ වැඩිහිටියන් වෙනුවෙන් පහසුකම් සපයනු ලබන වැඩිහිටි නිවාසයක් විය යුතුයි.
4. වැඩිහිටියන් 05 ක් හෝ ඊට වඩා මේ වන විට සේවය සපයන වැඩිහිටි නිවාසයක් විය යුතුයි.



Scanned with CamScanner

5. ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පිහිටි වැඩිහිටි නිවාසය පිහිටි ඉඩම පර්චස් 40ක් හෝ ඊට වඩා විශාල විය යුතු අතර, නගර සභා හෝ මහා නගර සභා සීමාව තුළ පර්චස් 40ට අඩු ඉඩමක වුවද මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සපුරා තිබේ නම් ඒ පිළිබඳ සලකා බලනු ලැබේ.
6. වැඩිහිටි නිවාසය අයත් සංවිධානය, ආයතනය, පාලක සභාව හෝ පුද්ගලයා/පුද්ගලයින් විසින් වැඩිහිටි නිවාසයේ සිදු කිරීමට අදාල සංවර්ධන කටයුතු වෙනුවෙන් වන 'දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා අවබෝධතා ගිවිසුමකට' ප්‍රාදේශීය ලේකම් සමඟ ගිවිසුම් ගත විය යුතුය.
7. වැඩිහිටි නිවාසය පිහිටි ඉඩම රජයේ ඉඩමක් නොවන සෑම අවස්ථාවකදීම එම ඉඩම අයත් සංවිධානය, ආයතනය හෝ පුද්ගලයා/පුද්ගලයින් මේ සමඟ අමුණා ඇති 'දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා එකඟතා ගිවිසුම' නිසි පරිදි අත්සන් කර ඉදිරිපත් කල යුතුය.
8. අවශ්‍ය ඕනෑම අවස්ථාවක වැඩිහිටි විෂයට අදාළ රාජකාරි කටයුතු වල නිරත වී ඇති නිලධාරීන් හට අධීක්ෂණ හා පරීක්ෂණ කටයුතු වෙනුවෙන් මැදිහත් වීමට අවස්ථාව සැලසිය යුතුයි.
9. අත්‍යවශ්‍ය අවස්ථාවක දී ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් වැඩිහිටි නිවාසයට වැඩිහිටියකු ඇතුලත් කිරීම සඳහා ඉල්ලීම් කල විට, ඒ සඳහා අවම වශයෙන් නේවාසික වැඩිහිටියන්ගෙන් 20%ක ප්‍රමාණයක් නිවාසගත කිරීම සඳහා අවස්ථාව සලසා දීමට කැමැත්ත පලකරන (2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ දෙවන කොටසේ 15 (3) වගන්තිය ප්‍රකාරව) වැඩිහිටි නිවාසයක් විය යුතුයි.
10. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත් කර ඇති වැඩිහිටි උවටැන් නිවාස සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතියට (1506:2015) අනුකූලව අළුත්වැඩියාවන් සිදු කිරීම හා උපකරණ මිලදී ගැනීම් සිදු කල යුතුය.
11. ඉඩම හෝ ගොඩනැගිලි කුලී පදනම මත හෝ බදු පදනම මත ලබාගෙන පවත්වාගෙන යනු ලබන්නේ නම් දීර්ඝ කාලීන කුලී හෝ බදු ගිවිසුම් සහිත වැඩිහිටි නිවාස සඳහා ප්‍රතිපාදන ලබාදීම සලකා බැලිය හැක.

- **ඉදිරිපත් කළ යුතු ලේඛන**

1. ඇමුණුම 02 සඳහන් ඉල්ලුම් පත්‍රයට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසයන්හි සිදු කල යුතු අලුත්වැඩියා කටයුතු සහ උපකරණ ලබා දීම පිළිබඳ තොරතුරු එක්රැස් කර ගත යුතුවේ.(වැඩිහිටි නිවාසය මගින් ඉල්ලීම් ලිපියක් ලබා ගත යුතුය.මිලියන 02 ට වඩා වැඩි මුදලක් අදාළ ව්‍යාපෘතිය සඳහා වැය වන්නේනම් එම මුදල ලබා ගන්නා ආකාරය පිළිබඳ ලිඛිතව දන්වා එවිය යුතුය.)
2. එක්රැස් කරගත් තොරතුරු සම්පූර්ණ කර ඇති ඉල්ලුම් පත්‍ර වලට අනුව ප්‍රතිලාභීන් තොරාගැනීමේ කොන්දේසි සහ ප්‍රමුඛතා වලට අනුකූලව වැඩිහිටි නිවාස තෝරා ගැනීම.
3. තෝරාගන්නා ලද වැඩිහිටි නිවාසයන්හි සිදු කල යුතු අළුත්වැඩියා කටයුතු සහ උපකරණ ලබාදීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත් කර ඇති වැඩිහිටි උවටැන් නිවාස ප්‍රමිතියට(1506-2015) අනුකූලව ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව ඉදිරිපත්කල යුතුය. (විධිමත් පරිදි සකස් කල ඇස්තමේන්තුව ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුයි.)



Scanned with CamScanner

4. ඉහත වැඩසටහන යටතේ ආධාර මුදල් ලබා දෙන සෑම වැඩිහිටි නිවාසක් සමග ගිවිසුම්ගත විය යුතු "දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා අවබෝධතා ගිවිසුම" (ඇමුණුම 04) හා වැඩිහිටි නිවාසය පිහිටි ඉඩම රජයේ ඉඩමක් නොවන සෑම අවස්ථාවකදීම එම ඉඩම අයත් සංවිධානය, ආයතනය හෝ පුද්ගලයා/පුද්ගලයින් මේ සමග අමුණා ඇති "දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා එකගතා ගිවිසුම" (ඇමුණුම 03) නිසි පරිදි අත්සන් කර ඉදිරිපත් කල යුතුය. ( මෙම ගිවිසුම් වල එක් මුල් පිටපතක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත යොමුකල යුතු අතර අනෙක් මුල් පිටපත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ගත යුතුවේ).

5. වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/ සංවර්ධන නිලධාරි (වැඩිහිටි)/සමාජ සේවා නිලධාරි/සංවර්ධන නිලධාරි(සමාජ සේවා) සහතික කරනු ලැබූ ඉල්ලුම් පත්‍රය සහ ඇස්තමේන්තුව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව මෙම කාර්යාලය වෙත යොමු කල යුතුය.

6. සුදුසුකම්ලත් වැඩිහිටි නිවාස වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් වෙත මුදල් පහත පියවරයන් යටතේ චෙක්පත් මගින් බැර කිරීමට කටයුතු කරනු ඇත.
   I. **අත්තිකාරම් ගෙවීම** - 20% (විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, ගිවිසුම් පිටපත් හා ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව)
   II. **බිල්පත් ගෙවීම** - 60% (සහතික කල බිල් පිටපත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව)
   III. **අවසන් ගෙවීම** - 20% (වැඩ අවසන් වාර්තා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව)

7. වැඩිහිටි විෂය භාර නිලධාරි විසින් ව්‍යාපෘතියට අදාලව මාසික භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තාව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කර මාසිකව මෙම කාර්යාලය වෙත යොමු කල යුතුය. (ඇමුණුම 05)

8. අලුත්වැඩියාවන් සඳහා භාණ්ඩ/ උපකරණ ලබා දෙනු ලබන අවස්ථාවකදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් භාණ්ඩ මිලදී ගැනීම සිදු කර වැඩිහිටි නිවාසයට සපයා දීම සිදුකල යුතුවේ.

9. මේ සඳහා ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2025 ජුනි මස 30 වන දින වේ.

**<u>05.අධීක්ෂණය හා පසු විපරම් කටයුතු</u>**

01.ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අදාල අරමුදල් ලැබීමෙන් අනතුරුව මුදල් භාරගැනීමේ කුවිතාන්සිය (පොදු 172 ) මෙම කාර්යාලය වෙත යොමු කල යුතුය.

02.විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදුකර සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු මගින් අදාල කාර්යය 2025.11.30 වන දිනට පෙර අවසන් කර 2025.12.15 ට පෙර අදාළ බිල්පත් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතුය.
03.මෙම ව්‍යාපෘති කිසි විටක 2026 වර්ෂයට අඛණ්ඩ නොවන බැවින් 2025 මෙම වර්ෂය තුළ වැඩ අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් මේ සඳහා යොමු කළ යුතුය.



Scanned with CamScanner

# දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා එකඟතා ගිවිසුමයි

මෙහි මින්මතු පළමු පාර්ශවය යනුවෙන් සඳහන් කෙරෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2011 අංක 05 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් සථාපිත වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙනුවෙන් ........................................................................................................ දිස්ත්‍රික්කයේ ........................................................................................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් වන ........................................................................................................................................................ ........................................................................................ යන අය

(එකී ප්‍රාදේශීය ලේකම් සහ එම ධූරයට තත්කාලීනව පත්වන්නන්, වැඩබලන්නන් සහ එම ධූරයට අයත් කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටුකරනු ලබන්නන් ද) පළමු පාර්ශවයට ද,

........................................................................................................................................................
ලිපිනයෙහි පිහිටි (විහාරස්ථානයේ / පූජ්‍ය ස්ථානයේ / ආයතනයේ/ ස්ථානයේ) .............................. (විහාරාධිපති / පියතුමා / කන්‍යා සොහොයුරිය/ භාරකරු / හිමිකරු ) .................................... වන ( සම්පූර්ණ නම) ........................................................................................................................................................ ........................................................................................................ (ජා: හැ: අංකය : ............................................ )

(එකී (නායක සවාමීන් වහන්සේ / පියතුමා / කන්‍යා සොහොයුරිය / භාරකරු / හිමිකරු) ........................................................................ සහ එම (විහාරස්ථානයේ / පූජ්‍ය ස්ථානයේ / ආයතනයේ /ස්ථානයේ ) ...................................................................... (විහාරාධිපති / පියතුමා / කන්‍යා සොහොයුරිය/ භාරකරු / හිමිකරු ) ........................................................................ ධූරයට අනාගතයේ දී පත්වන (නායක ස්වාමීන් වහන්සේලා / පූජක තුමන්ලා / භාරකරුවන් / හිමිකරුවන් ) ........................................................................ සහ උරුමක්කාර, පොල්මඃකාර, අද්මිනිස්ත්‍රාසිකාර, බලකාර, ලැබුම්කාර ආදීන්ගේ ද ) දෙවන පාර්ශවයට ද,

බැඳී එකී පාර්ශවය අතර වර්ෂ දෙදහස්.............................. ක් වූ ................................... මස ....................... වන දින (20........./......../........) පහත සඳහන් පොරොන්දු ගිවිසුම් වලට යටත්ව මෙම ගිවිසුමට එළඹෙන ලදි.

**ඒ අනුව සියල්ලෝම දැනගත යුතු වග නම්:-**

1. නියෝජනය කිරීම සහ වගකීම්

1.1. මෙම ගිවිසුමට එළඹීමට සහ මෙම ගිවිසුම යටතේ ඇති බැඳීම් නිසි පරිදි ඉටුකිරීමට තමන්ට සම්පූර්ණ අයිතිය, බලය, හැකියාව සහ අධිකාරිය ඇති බවට එක් එක් පාර්ශව කරුවන් විසින් අනෙක් පාර්ශවය වෙත වගකියනු ලැබේ.

1.2. මෙම ගිවිසුම සඳහා එළඹීමට අවශ්‍ය කරන සෑම සියළු තොරතුරක් ම සහ කරුණක් ම පාර්ශව කරුවන් විසින් ලබාදෙනු ලැබේ.

1.3. මෙම ගිවිසුම සම්පූර්ණ වශයෙන්ම පළමු පාර්ශවය හා දෙවන පාර්ශවය අතර පවතින ගිවිසුමක් වන අතර මෙම ගිවිසුම යටතේ තමන්ට පැවරෙන යුතුකම්, වගකීම් සහ බැඳීම් තෙවන පාර්ශවයක් වෙත පැවරිය නොහැක.

2. ගිවිසුම් කාලය

මෙම ගිවිසුම වර්ෂ දෙදහස් .................................. ක් වූ ................................................මස ....................... වන (20......./....../......) දිනෙන් ආරම්භ වී වර්ෂ දෙදහස් ............................... ක් වූ ................................... මස ............................ වන දින (20....../....../.....) දක්වා වූ වසර 30ක (තිහක) කාලයක් සඳහා වලංගු වේ.

Scanned with CamScanner

3. පළමු පාර්ශවයේ හිමිකම් සහ බැඳීම්

3.1. පළමු පාර්ශවය වන වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත දෙවන පාර්ශවය විසින් කාර්යය සිදු කරගෙන යාම සඳහා ලබා දෙනු ලබන භූමියෙහි (ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය / පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ / වෙනත් සඳහන් කරන්න) ........................................................................................................ ලියාපදිංචි ........................................................... අංකය දරණ (සංගමය / පදනම / සමිතිය / සංවිධානය/ වෙනත් සඳහන් කරන්න) ........................................................................................ විසින් පවත්වාගෙන යනු ලබන ............................................................ දිස්ත්‍රික්කයේ ............................................................................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ......................................................................................................... ග්‍රාම නිලධාරී වසමේ ......................................................................................................................... ......................................................................................... යන ලිපිනයෙහි පවත්වාගන යනු ලබන .................... වර්ෂයේ (ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය /පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ / වෙනත් සඳහන් කරන්න ) ............................................................................................. ........................................................... ලියාපදිංචි ............................................................ අංක දරණ (වැඩිහිටි නිවාසයේ නම) ...................................................................................................... ................................................................ යන වැඩිහිටි උවටැන් නිවාස සඳහා (නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම / අළුත්වැඩියාවක් / ඉදිකිරීමක් / වෙනත් සඳහන් කරන්න) ................................................................................................................................................ ............................................................ සිදු කරනු ලැබේ.

3.2. එම ගොඩනැගිල්ල තුළ ( සංගමයේ / පදනමේ / සමිතියේ / සංවිධානයේ / ආයතනය නම) ................................................................................... විසින් පවත්වාගෙන යනු ලබන (වැඩිහිටි නිවාසයේ නම) ................................................................................................ .................................................... යන වැඩිහිටි උවටැන් නිවාසය නිසි පරිදි පවත්වාගෙන යාම ................................................ ප්‍රාදේශීය ලේකම් මගින් අධීක්ෂණය සිදුකිරීම.

3.3. ඉහත 3.1 හි සඳහන් කාර්යය සඳහා වන වියදම දෙපාර්ශවය විසින් ම දරණු ලබන බවට දෙපාර්ශවයම එකඟ වේ.

4. දෙවන පාර්ශවයේ හිමිකම් සහ බැඳීම්

4.1. දෙවන පාර්ශවය විසින් සිය (විහාර / පූජා ස්ථාන / ආයතන / වෙනත් සඳහන් කරන්න) ............................................................ භූමියේ ඉහත 3.1 කාර්යය සඳහා සුදුසු (ඉඩම / ඉඩම් කොටස ) .................................. එනම් , අක්කර ................. රූඩ් .................. පර්චස් ....................... ක ප්‍රමාණයක් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත පවරා දීමට මෙයින් එකඟ වේ.

Scanned with CamScanner

4.2. එම භූමිය තුළ පළමු පාර්ශවය විසින් සිදුකරන් ලබන ඉහත 3.1 කාර්යය සඳහා ද එම ගොඩනැගිල්ල තුළ (සංගමයේ / පදනමේ / සමිතියේ / සංවිධානයේ / ආයතනයේ නම ) ........................................................ විසින් පවත්වාගෙන යනු ලබන (වැඩිහිටි නිවාසයේ නම) ........................................................ ........................................................ යන වැඩිහිටි උවටැන් නිවාසය නිසි පරිදි , කිසිදු බාධාවකින් හා අවහිරතාවයකින් තොරව පවත්වාගෙනයාම සඳහා අවසර දෙන බවට දෙවන පාර්ශවය එකඟ වේ.

5. මෙම ගිවිසුම් පත්‍රයේ වගන්ති සබැඳියාව දෙපාර්ශවයේ යම් ගැටලුකාරී තත්වයක් උද්ගත වුව හොත් එය සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමටත්, එසේ නොහැකි වූ හොත් දිස්ත්‍රික් ලේකම් තුමා සමඟ සාකච්ඡාකර විසඳා ගැනීමටත්, එසේ ද විසඳා ගැනීමට අපොහොසත් වන යම් ගැටළුවක් වේ නම්, වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර විසඳා ගැනීමට දෙපාර්ශවය මෙයින් එකඟ වේ.

6. මෙම ගිවිසුම් පත්‍රය සම්බන්ධයෙන් වන සියලුම කටයුතු නීත්‍යානුකූලව අවසන් වන තෙක් අවශ්‍ය සෑම අවස්ථාවකම ඒ සම්බන්ධව ඉහත කොන්දේසි ප්‍රකාරව කටයුතු කරන බවට ත්, මෙම ගිවිසුම දෙපාර්ශවයේම එකඟතාවය මත අවසන් කරන තෙක් කිසිදු හේතුවක් නිසාවෙන් ගිවිසුම් පත්‍රයේ කොන්දේසිවලින් ඉවත් නොවන බවට ත් දෙපාර්ශවය මෙයින් එකඟ වේ.

7. මෙම ගිවිසුම් පත්‍රය සම්බන්ධව සිදුවන සෑම ලිපි ගණුදෙනුවක් ම ඉහත සඳහන් කරන ලද ලිපිනයන් අනුව සිදුවන අතර එකී ලිපිනයන්ගේ යම් වෙනසක් සිදුවන්නේ නම් ලිපිනයන් වෙනස් කරනු ලබන පාර්ශවය විසින් අනෙක් පාර්ශවය වෙත දින හතක් ඇතුළත දැනුම් දීමට එකඟවේ.

8. මෙම ගිවිසුමට අදාලව දෙවන පාර්ශවය විසින් සිදුකරනු ලබන යම්කිසි පවරාදීමක් සම්බන්ධව එකී පාර්ශවයට වන්දි අයකරගැනීමට ඇති අයිතිය එකී දෙවන පාර්ශවය විසින් මෙයින් අත්හරින බවට දෙපාර්ශවයම පිළිගනී. ඒ බව සනාථ කිරීම සඳහා දෙවන පාර්ශවය විසින් ලබාදෙන ලද දිවුරුම් ප්‍රකාශය (X) ලෙස සළකුණුකොට මෙම ගිවිසුමේ කොටසක් ලෙස පවතී.

9. මෙම ගිවිසුමට අදාලව දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත පවරන ලද දේපල වලට අදාල පැවරුම් ඔප්පුව (Xi) ලෙස සළකුණුකොට මෙම ගිවිසුමේ කොටසක් ලෙස පවතින බවට දෙපාර්ශවයම පිළිගනී.

10. මෙම ගිවිසුම ලියාපදිංචි නොකිරීම මත මෙම ගිවිසුමේ නීත්‍යානුකූල භාවයට හානියක් සිදු නොවන බවට දෙපාර්ශවය විසින් ම පිළිගනී.

ඉහත සඳහන් පොරොන්දු ගිවිසුම් හොඳින් කියවා තේරුම් ගෙන ඊට එකඟ වූ පළමු පාර්ශවයට බැඳුණු වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙනුවෙන් ........................................................ දිස්ත්‍රික්කයේ ........................................................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් සහ දෙවන පාර්ශවයට බැඳුණු (සම්පූර්ණ නම) ........................................................ ........................................................ (ජා: හැ: අංකය : ........................................ ) යන අයට ද

මෙයටත් මෙම වගන්තිය දරණ තවත් ලියවිලි දෙකකටත් වර්ෂ දෙදහස් ............................. ක් වූ ....................................................... මස ............................................ වන දින (20........../....../......) ................................................................... දී අත්සන් තබන ලදි.

.........................................................

.............................................. ප්‍රාදේශීය ලේකම්
පළමු පාර්ශවය

පළමු පාර්ශවයේ සාක්ෂි

I. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

II. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

.........................................................

.........................................................................................
දෙවන පාර්ශවය

දෙවන පාර්ශවයේ සාක්ෂි

I. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

II. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

Scanned with CamScanner

# දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා අවබෝධතා ගිවිසුමයි

මෙහි මින්මතු පළමු පාර්ශවය යනුවෙන් සඳහන් කෙරෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2011 අංක 05 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් සථාපිත වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙනුවෙන් ........................................................................................................ දිස්ත්‍රික්කයේ ........................................................................................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් වන ........................................................................................................................................................................ ........................................................................................ යන අය

(එකී ප්‍රාදේශීය ලේකම් සහ එම ධූරයට තත්කාලීනව පත්වන්නන්, වැඩබලන්නන් සහ එම ධූරයට අයත් කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටුකරනු ලබන්නන් ද) පළමු පාර්ශවයට ද,

........................................................................................................................................................................

ලිපිනයෙහි පිහිටි (විහාරස්ථානයේ / පූජ්‍ය ස්ථානයේ / ආයතනයේ/ ස්ථානයේ) ................................ (විහාරාධිපති / පියතුමා / කන්‍යා සොහොයුරිය/ භාරකරු / හිමිකරු ) ..................................... වන ( සම්පූර්ණ නම) ........................................................................................................................................................................ ........................................................................................................ (ජා: හැ: අංකය : ........................................ )

(එකී (නායක සවාමීන් වහන්සේ / පියතුමා / කන්‍යා සොහොයුරිය / භාරකරු / හිමිකරු) ........................................................................ සහ එම (විහාරස්ථානයේ / පූජ්‍ය ස්ථානයේ / ආයතනයේ /ස්ථානයේ ) ...................................................................... (විහාරාධිපති / පියතුමා / කන්‍යා සොහොයුරිය/ භාරකරු / හිමිකරු ) ................................................................. ධූරයට අනාගතයේ දී පත්වන (නායක ස්වාමීන් වහන්සේලා / පූජක තුමන්ලා / භාරකරුවන් / හිමිකරුවන් ) ......................................................................... සහ උරුමක්කාර, පොල්මංකාර, අද්මිනිස්ත්‍රාසිකාර, බලකාර, ලැබුම්කාර ආදීන්ගේ ද ) දෙවන පාර්ශවයට ද,

බැඳී එකී පාර්ශවය අතර වර්ෂ දෙදහස්............................. ක් වූ ................................ මස ........................ වන දින (20........./......../........) පහත සඳහන් පොරොන්දු ගිවිසුම් වලට යටත්ව මෙම ගිවිසුමට එළඹෙන ලදි.

**ඒ අනුව සියල්ලෝම දැනගත යුතු වග නම්:-**

1. නියෝජනය කිරීම සහ වගකීම්

1.1. මෙම ගිවිසුමට එළඹීමට සහ මෙම ගිවිසුම යටතේ ඇති බැඳීම් නිසි පරිදි ඉටුකිරීමට තමන්ට සම්පූර්ණ අයිතිය, බලය, හැකියාව සහ අධිකාරිය ඇති බවට එක් එක් පාර්ශව කරුවන් විසින් අනෙක් පාර්ශවය වෙත වගකියනු ලැබේ.

1.2. මෙම ගිවිසුම සඳහා එළඹීමට අවශ්‍ය කරන සෑම සියළු තොරතුරක් ම සහ කරුණක් ම පාර්ශව කරුවන් විසින් ලබාදෙනු ලැබේ.

1.3. මෙම ගිවිසුම සම්පූර්ණ වශයෙන්ම පළමු පාර්ශවය හා දෙවන පාර්ශවය අතර පවතින ගිවිසුමක් වන අතර මෙම ගිවිසුම යටතේ තමන්ට පැවරෙන යුතුකම්, වගකීම් සහ බැඳීම් තෙවන පාර්ශවයක් වෙත පැවරිය නොහැක.

2. ගිවිසුම් කාලය

මෙම ගිවිසුම වර්ෂ දෙදහස් ............................... ක් වූ ..............................................මස ....................... වන (20......./....../......) දිනෙන් ආරම්භ වී වර්ෂ දෙදහස් ............................. ක් වූ ................................ මස ......................... වන දින (20....../....../.....) දක්වා වූ වසර 30ක (තිහක) කාලයක් සඳහා වලංගු වේ.

Scanned with CamScanner

3. පළමු පාර්ශවයේ හිමිකම් සහ බැදීම්

3.1. පළමු පාර්ශවය වන වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත දෙවන පාර්ශවය විසින් කාර්යය සිදු කරගෙන යාම සඳහා ලබා දෙනු ලබන භූමියෙහි (ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය / පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ / වෙනත් සඳහන් කරන්න) ........................................................................................................ ලියාපදිංචි ........................................................ අංකය දරණ (සංගමය / පදනම / සමිතිය / සංවිධානය/ වෙනත් සඳහන් කරන්න) ........................................................................................ විසින් පවත්වාගෙන යනු ලබන .............................................................................. දිස්ත්‍රික්කයේ ........................................................................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ........................................................................................ ග්‍රාම නිලධාරී වසමේ ........................................................................................................................ ........................................................................................ යන ලිපිනයෙහි පවත්වාගන යනු ලබන ................... වර්ෂයේ (ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය /පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ / වෙනත් සඳහන් කරන්න ) ........................................................................................ ........................................................ ලියාපදිංචි ........................................................ අංක දරණ (වැඩිහිටි නිවාසයේ නම) ........................................................................................ ........................................................ යන වැඩිහිටි උවටැන් නිවාස සඳහා (නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම / අළුත්වැඩියාවක් / ඉදිකිරීමක් / වෙනත් සඳහන් කරන්න) ........................................................................................................................ ........................................................ සිදු කරනු ලැබේ.

3.2. එම ගොඩනැගිල්ල තුළ ( සංගමයේ / පදනමේ / සමිතියේ / සංවිධානයේ / ආයතනය නම) ........................................................................................ විසින් පවත්වාගෙන යනු ලබන (වැඩිහිටි නිවාසයේ නම) ........................................................................................ ........................................................ යන වැඩිහිටි උවටැන් නිවාසය නිසි පරිදි පවත්වාගෙන යාම ........................................................ ප්‍රාදේශීය ලේකම් මඟින් අධීක්ෂණය සිදුකිරීම.

4. දෙවන පාර්ශවයේ හිමිකම් සහ බැදීම්

4.1. දෙවන පාර්ශවය විසින් සිය (විහාර / පූජ්‍ය ස්ථාන / ආයතන / වෙනත් සඳහන් කරන්න) ........................................................ භූමියේ පවත්වාගෙන යනු ලබන වැඩිහිටි උවටැන් නිවාසය, අවශ්‍ය ඕනෑම අවස්ථාවක වැඩිහිටි විෂයට අදාල රාජකාරි කටයුතු වල නිරත වී ඇති නිලධාරීන් හට අධීක්ෂණ හා පරීක්ෂණ කටයුතු වෙනුවෙන් මැදිහත් වීමට අවස්ථාව ලබාදීමට මෙයින් එකඟ වේ.

4.2. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් අත්‍යාවශ්‍ය අවස්ථාවක දී එම භූමිය තුළ පළමු පාර්ශවය විසින් සිදුකරනු ලබන ඉහත 3.1 කාර්යය සඳහා ද එම ගොඩනැගිල්ල තුළ (සංගමයේ / පදනමේ / සමිතියේ / සංවිධානයේ / ආයතනයේ නම ) ........................................................................................

Scanned with CamScanner

විසින් පවත්වාගෙන යනු ලබන (වැඩිහිටි නිවාසයේ නම) .......................................................................

................................................................................................................. යන වැඩිහිටි උපවැන් නිවාසයට වැඩිහිටියකු ඇතුලත් කිරීම සඳහා ඉල්ලීම් කල විට, ඒ සඳහා අවම වශයෙන් නේවාසික වැඩිහිටියන්ගෙන් 20%ක ප්‍රමාණයක් නිවාසගත කිරීම සඳහා අවස්ථාව සලසා දීමට කැමැත්ත පලකරන අතර (2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ දෙවන කොටසේ 15 (3) වගන්තිය ප්‍රකාරව), නිසි පරිදි , කිසිදු බාධාවකින් හා අවහිරතාවයකින් තොරව පවත්වාගෙනයාම සඳහා අවසර දෙන බවට දෙවන පාර්ශවය එකඟ වේ.

5. මෙම ගිවිසුම් පත්‍රයේ වගන්ති සබැඳියාව දෙපාර්ශවයේ යම් ගැටලුකාරී තත්වයක් උද්ගත වුව හොත් එය සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමටත්, එසේ නොහැකි වූ හොත් දිස්ත්‍රික් ලේකම් තුමා සමඟ සාකච්ඡාකර විසඳා ගැනීමටත්, එසේ ද විසඳා ගැනීමට අපොහොසත් වන යම් ගැටළුවක් වේ නම්, වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර විසඳා ගැනීමට දෙපාර්ශවය මෙයින් එකඟ වේ.

6. මෙම ගිවිසුම් පත්‍රය සම්බන්ධයෙන් වන සියලුම කටයුතු නීත්‍යානුකූලව අවසන් වන තෙක් අවශ්‍ය සෑම අවස්ථාවකම ඒ සම්බන්ධව ඉහත කොන්දේසි ප්‍රකාරව කටයුතු කරන බවට ත්, මෙම ගිවිසුම දෙපාර්ශවයේම එකඟතාවය මත අවසන් කරන තෙක් කිසිදු හේතුවක් නිසාවෙන් ගිවිසුම් පත්‍රයේ කොන්දේසිවලින් ඉවත් නොවන බවට ත් දෙපාර්ශවය මෙයින් එකඟ වේ.

7. මෙම ගිවිසුම් පත්‍රය සම්බන්ධව සිදුවන සෑම ලිපි ගණුදෙනුවක් ම ඉහත සඳහන් කරන ලද ලිපිනයන් අනුව සිදුවන අතර එකී ලිපිනයන්ගේ යම් වෙනසක් සිදුවන්නේ නම් ලිපිනයන් වෙනස් කරනු ලබන පාර්ශවය විසින් අනෙක් පාර්ශවය වෙත දින හතක් ඇතුළත දැනුම් දීමට එකඟවේ.

8. මෙම ගිවිසුම ලියාපදිංචි නොකිරීම මත මෙම ගිවිසුමේ නීත්‍යානුකූල භාවයට හානියක් සිදු නොවන බවට දෙපාර්ශවය විසින් ම පිළිගනී.

ඉහත සඳහන් පොරොන්දු ගිවිසුම් හොඳින් කියවා තේරුම් ගෙන ඊට එකඟ වූ පළමු පාර්ශවයට බැඳුණු වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙනුවෙන් ....................................................................... දිස්ත්‍රික්කයේ ....................................................... ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් සහ දෙවන පාර්ශවයට බැඳුණු (සම්පූර්ණ නම) .........................................................................................................

...................................................................................... (ජා: හැ: අංකය : ........................................ ) යන අයට ද

මෙයටත් මෙම වගන්තිය දරණ තවත් ලියවිලි දෙකකටත් වර්ෂ දෙදහස් .............................. ක් වූ ........................................................ මස ............................................. වන දින (20........./....../......) ........................................................................ දී අත්සන් තබන ලදි.

............................................................

............................................... ප්‍රාදේශීය ලේකම්
පළමු පාර්ශවය

පළමු පාර්ශවයේ සාක්ෂි

I. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

II. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

............................................................

..................................................................
දෙවන පාර්ශවය

දෙවන පාර්ශවයේ සාක්ෂි

I. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

II. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

Scanned with CamScanner

ඇමුණුම 05

# මාසික භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තාව

## වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල මඟින් ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම වෙනුවෙන් අළුත්වැඩියාව හා අවශ්‍ය උපකරණ ලබා දීම - 2025

මාසය:-.................................

| | |
|---|---|
| වැඩිහිටි නිවාසයේ නම | |
| වෙන් කල මුළු ආධාර මුදල (රු:) | |
| මෙතෙක් ලැබී ඇති ආධාර මුදල් ප්‍රමාණය (රු:) | |
| කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වූ දිනය | 2025/....../...... |
| ව්‍යාපෘතිය අවසන් කල යුතු දිනය | 2025/....../...... |

| භෞතික ප්‍රගතිය (භෞතික ප්‍රගතිය කෙටියෙන් දක්වන්න) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

සකස් කලේ:-.........................................

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/ සංවර්ධන නිලධාරි(වැඩිහිටි)/සමාජ සේවා නිලධාරි/ සංවර්ධන නිලධාරි(සමාජ සේවා)

අනුමත කලේ:-.................................... දිනය:- ..............................

Scanned with CamScanner